# 14 ප්‍රස්තාව පිරුළු

භාෂාව භාවිතයේ දී කිසියම් අදහසක් මනාව පැහැදිලි ව කෙටියෙන් සිත් අදනා අයුරින් ප්‍රකාශ කිරීම අපහසුවන කල්හි සමාජ ව්‍යවහාරයෙහි පවත්නා කියමන් ඒ සඳහා ආදේශ කර ගැනීම සිරිතකි.

ජීව භාෂාවක් වන සිංහලයේ අදහස් පැහැදිලි ව කෙටියෙන් ප්‍රකාශ කරන ක්‍රම අතර සම්ප්‍රදායට හිමි වන්නේ උසස් තැනකි. එහි දී ප්‍රස්තාව පිරුළු හෙවත් පිරුළු වැදගත් තැනක් ගනී. ආප්තෝපදේශවල දී හුදු උපදේශයට මුල් තැන ලැබෙන අතර ප්‍රස්තාව පිරුළු භාවිතයේ දී අදහසට පුළුල් බවත් රසවත් බවත් සංක්ෂිප්ත බවත් මූලික ව ඉදිරිපත් වේ.

කිසියම් අදහසක් මනා ව කෙටියෙන් පැහැදිලි ව ප්‍රකාශ කිරීම පහසු කර ගැනීම සඳහා සමාජ ව්‍යවහාරයෙහි පවත්නා කියමන් යොදා ගැනීම අප අතර පවත්නා සාමාන්‍ය පුරුද්දකි. මෙසේ යොදා ගන්නා කියමන් කිසියම් ඇත්තක් හෝ සිද්ධියක් හෝ කතාවක් මුල් කොට ගෙන කටින් කට ව්‍යවහාරයට පත් වේ. එබඳු කියමන් **ප්‍රස්තාව පිරුළු** හෙවත් පිරුළු නමින් හැඳින්වේ. මේ පිරුළු අද්‍යතන ව්‍යවහාරයට පත් වී ඇත්තේ පැරණියන්ගේ ව්‍යවහාර ඔස්සේ ය. පිරුළු මෙන් ම ජනවහරේ පවත්නා යෙදුම් විශේෂයකි ආප්තෝපදේශ. 'ආප්ත', 'උපදේශ' යන පද දෙක එකතු වීමෙන් මෙය සකස් වී ඇත. 'ආප්ත' යනු වැඩිහිටි, දූනුමැති, දක්ෂ, විචක්ෂණ පුද්ගලයන් හැඳින්වෙන යෙදුමකි. එවැන්නන්ගෙන් ලැබෙන උපදේශ ආප්තෝපදේශ යි. ආප්තෝපදේශයකින් හුදු උපදේශයක් ම ඉදිරිපත් කෙරේ. 'උඩ පැන්නොත් බිම වැටේ' 'වචන්නෝ දිනන්නෝ ය' වැනි ව්‍යවහාර ආප්තෝපදේශ වේ. ප්‍රස්තාව පිරුළක ස්වරූපය මීට වඩා වෙනස් ය. ඉන් හුදු උපදේශයක් නොදී කිසියම් අවස්ථාවකට යෝග්‍ය අදහසක් පුළුල් ලෙස හා රසවත් ව කෙටියෙන් ඉදිරිපත් කෙරේ.

කතාබහේ දී, රචනයේ දී පිරුළු යෙදීමෙන් සැලසෙන වාසි කීපයකි. නිසි තැන්හි නිසි ලෙස පිරුළු යෙදීම නිසා කියමන් ප්‍රාණවත් වේ. සිත් ඇදගන්නාසුලු වේ. කෙටි කාලයකින් හා අඩු ආයාසයකින් වැඩි තොරතුරක් ඉදිරිපත් කිරීමට හැකි වේ. පිරුළු කීපයක් විමසා බලමු.

**"ඉඟුරු දී මිරිස් ගත්තා වගෙයි."**

මිරිස් හා ඉඟුරු යන දෙවගය ම කට දනසුලු ය. ඉනිදු මිරිස්වල පවත්නා කට දනසුලු ගතිය වැඩි ය. එක් පීඩාවකින් වැළකෙනු සඳහා ඊට ද වැඩි යැයි සැලකිය හැකි පීඩාවක් ළං කර ගැනීම ගැන කීමේ දී මේ පිරුළ ව්‍යවහාර වේ. මහනුවර රජ කළ දෙවන රාජසිංහ රජු පෘතුගීසීන් මෙරටින් පලවා හරිනු වස් ඔවුන්ට ද වඩා කපටිකමින් දැඩි වූ ලන්දේසීන් ළං කර ගැනීමේ සිද්ධිය මේ පිරුළෙන් ප්‍රකාශ වෙයි.

යමෙක් තමා වැරදි කරමින් අනුනට ගුණ දහම්තිකම් කියත් නම් එබඳු විටෙක දී ඔහුගේ කියුම් වැදි බණ ලෙස සමාජය හඳුන්වයි. තමා නො කරන යහපත් දෑ කරන ලෙස කියමින් අනෙකකුට ඔවා දෙන කල්හි 'වැදි බණ' යන පිරුළ යෙදේ. මේ එය යෙදුණු පද්‍යයකි.

**"ඔවා දෙනු පරහට - තමා සම්මතෙහි පිහිටා සිට**
**දුසිරිත දනන් දෙන - ඔවා වැද්දන් කියන බණ වැනි"**

බොහෝ පිරුළු නිර්මාණය වී ඇත්තේ කතා පුවත් මුල් කොට ගෙන ය. නිදසුනක් වශයෙන් '**හණමිටිකාරයා**' යන පිරුළ හා බැඳුණු කතා පුවත දැක්විය හැකි ය. යහළුවෝ දෙදෙනෙක් කිසියම් කටයුත්තක් සඳහා තම ගමින් බැහැර ව දින කීපයක් සිට ආපසු ගමට යන්නට කල ආ බව දන ගමට ගෙන යන්නේ කුමක් දැයි විමසූහ. එහි වූයේ හණ පමණි. දෙදෙනා ම ලොකු හණමිටි දෙකක් බැඳගෙන ගම බලා ගමන් ඇරඹූහ. අතර මග වූ එක් ගමක හණ හූ වට ද ඊළඟ ගමේ හණරෙදි ද තවත් දුරු ගමක පට පිළී ද ඊට ද දුරු ගමක රන් රිදී මුතු මැණික් ද මිනිස්සු පිනට දුන්හ. මගට පිළිපන් දෙදෙනාගෙන් නුවණැත්තා ඒ ඒ ගමේ දී තමා ගෙන ආ අගය අඩු දෑ බිම තබා අගය වැඩි දෑ පොදි කොට ගෙන ගෙදර ගියේ ය. නුවණ මඳ තැනැත්තා මෙතෙක් දැඩි වෙහෙසක් දරා මා උසුලා ගෙන ආ හණ මිටිය හැර දැමීම ද්‍රෝහී ක්‍රියාවක් යැයි සිතා පුරුදු හණ මිටිය ම ගෙදර ගෙන ගියේ ය. රන් රිදී මුතු මැණික් ලත් ගෙදර ඇත්තන් මහ උත්සවශ්‍රීයෙන් දවස ගෙවද්දී හණ මිටියට ම බැඳී සිටියහුගේ ගෙදර ඇත්තෝ අඳුරට ම ඉඩ දී නිකට අල්ලේ තබා ගෙන දුක්බර ව හුන් හ.

ඇත්ත නැත්ත, සරු බව නිසරු බව, යුක්තිය අයුක්තිය ආදිය ගැන නොසිතා පරණ පුරුදු දෙයෙහි ම අවිචාර ව, ගතානුගතික ව ම ක්‍රියා කරන්නන් හැඳින්වීම සඳහා සමාජය හණමිටිකාරයා යන ප්‍රස්තාව පිරුළ යොදන බව පෙනේ.

ප්‍රස්තාව පිරුළ භාවිත කෙරෙන ආකාරය ද විවිධ ස්වරූප ගනී. සමහර ප්‍රස්තාව පිරුළක් කෙටි ය. තවත් පිරුළක් දීර්ඝ ය. සමහර පිරුළු පද්‍ය පාදයක් සේ තාලානුකූල ව කිය හැකි ය. ප්‍රස්තාව පිරුළක් නිර්මාණය විය යුත්තේ මේ මේ ආකාරයට යැයි නියමයක් ද නැත. බොහෝ ප්‍රස්තාව පිරුළු අගට **මෙන්, සේ, වැනි, වාගේ** යන නිපාත ද යෙදී තිබේ. එසේ වී ඇත්තේ කටවහරේ පහසුව නිසා ය.

**ප්‍රස්තාව පිරුළු මෙසේ වර්ග කර ගෙන ඉගෙනීමට ද හැකි ය.**

1. කිසියම් රිද්මයක් සහිත ව කියැවෙන ප්‍රස්තාව පිරුළු

**නිදසුන් :**

අනේ කාලේ වනේ වාසේ
උඩින් ඔපේ යටින් හපේ
විද්දේ හාවාට වැදුණේ පඳුරට
උඩින් හකුරු යටින් කතුරු

2. නෑ යන්න අගට යෙදී කිසියම් රිද්මයක් ගන්නා ප්‍රස්තාව පිරුළු

**නිදසුන් :**

නටපු තොයිලෙකුත් නෑ  බෙරේ පළුවකුත් නෑ
බල්ලට ඇති වැඩකුත් නෑ  හෙමින් ගමනකුත් නෑ
බල්ලා පිදුරු කන්නෙත් නෑ  කන ගොනාට දෙන්නෙත් නෑ

3. 'ලු' නිපාතය අගට යෙදී රිද්මයක් ඇති කරන ප්‍රස්තාව පිරුළු

**නිදසුන් :**

තැග්ගෙන් තැග්ග උතුම් තැග්ග ලු
ගමනට ඉණිමග කතාව ලු
ගස් නැති රටේ එඬරු ගහත් ගහක් ලු

4. 'සේ' නිපාතයෙන් අවසන් වන ප්‍රස්තාව පිරුළු

**නිදසුන් :**

අඹ විචාළවුන්ට දෙල් කියන්නා සේ
ආඳා යවා තබාලා වල්පත අතට ගත්තා සේ
උගුරට හොරා බේත් කන්නා සේ

ඉහත ප්‍රස්තාව පිරුළු උපමා ස්වරූපයක් ගන්නා අතර ඒවා බෙහෙවින් ම අන්තර්ගත ව ඇත්තේ පැරණි පොතපතේ ය.

5. වාගේ/වගෙයි යන්නෙන් අවසන් වන ප්‍රස්තාව පිරුළු

**නිදසුන් :**

අකලට පලගත් ගෙඩිය වගෙයි
අගේ ඉඳන් කන කනවා වාගෙයි
අටුවෙන් දුමට බැස්සා වාගේ
අතු කඩා මොර කන්නා වාගේ
පරංගියා කෝට්ටේ ගියා වාගේ

6. 'ද' නිපාතයෙන් අවසන් වන ප්‍රස්තාව පිරුළු

**නිදසුන් :**

ඇත්ත කියා පැත්තක් ගියත් මොක ද?
ඇහැළ පෙරහැරට බෙරත් හිඟ ද?
ඌරන්ට මොන අච්චාරු ද?
ළිපේ අළු ගාගන්න ආඬියාගෙන් අවසර මොට ද?

මෙසේ තවත් විවිධ රටාවලට ඇතුළත් කළ හැකි ප්‍රස්තාව පිරුළු විශාල සංඛ්‍යාවක් සිහල බසේ දක්නට ඇත.

## ක්‍රියාකාරකම 01

**මේ පිරුළුවලින් ප්‍රකාශ වන අදහස ලියන්න.**

i. විද්දේ හාවාට වැදුණේ පඳුරට
ii. ගිය ලූලා මහ එකාලු
iii. ආඬි හත්දෙනාගේ කැඳ හැළිය වගෙයි
iv. නියපොත්තෙන් කඩන්න තිබුණ ගහ පොරොවෙන් කපන්න බැරිවුණා
v. ඉත්තෑවාගේ ගෙට කැබැල්ලෑවා වැදුණා වගේ

## ක්‍රියාකාරකම 02

**මේ පිරුළු සම්පූර්ණ කරන්න.**

i. උගුරට හොරා.........................................කෑම වගෙයි.
ii. යුද්දෙට නැති කඩුව .......................................
iii. හැමදා නියං........................................................වලාවේ.
iv. ........................................................ කොට්ටේ මාරු කළා වගෙයි.

## ක්‍රියාකාරකම 03

**මුලින් දක්වා ඇති අදහස දීමට ඉතා ම සුදුසු පිරුළ තෝරන්න.**

1. සුළු දැනුමක් ඇති තැනැත්තා උඩගු වීම.

i. මහදැනමුත්තාගේ ගෝලයා වීම.
ii. ලූලා නැති වළට කනයා පණ්ඩිතයා.
iii. අතිපණ්ඩිතයාට ඒ දණ්ඩෙන් යන්න බැරිලු.
iv. අඩු කළය සෙලවේ.

2. අවවාදයෙන් ප්‍රයෝජන නොගන්නකුට අවවාද දීම.

i. අවවාදයට වඩා ආදර්ශය උතුම් ය.
ii. කකුළුවා පැටවාට කෙළින් යන්නට ඉගැන්නුවා වගෙයි.
iii. වඳුරාට දැළිපිහිය දුන්නා වගෙයි.
iv. බීරි අලියාට වීණා ගායනා කරනවා වගෙයි.

3. වරදක් කළ හොත් සිත එයට සාක්ෂ්‍ය දරයි.

i. හිත ඇත්නම් පත කුඩා ද.
ii. වැරදුණ දට කවුරුත් නැත තමන් මිස.

iii. අබ කෑ මිනිහාගේ මොළේ දන්නා වගේ.
iv. අනුන්ගේ වරද ලොකුවට පේනවා වගෙයි.

4. යමක් ක්‍රියාත්මක නො කොට කතාවට පමණක් සීමා කිරීම.

i. හතර බීරි කතාව වගෙයි.
ii. කණා කිරේ පාට කිව්ව වගෙයි.
iii. කටින් බතල කොළ සිටුවනවා වගෙයි.
iv. ආඬි හත්දෙනාගේ කැඳහැළිය වගෙයි.

5. යහපත් දෙයකට තවත් යහපත් දෙයක් එකතු වීම.

i. කොහොඹ ගහට කරවිල වැල ගියා වගෙයි.
ii. කිරි මූදට හඳ පෑවුවා වගෙයි.
iii. ගහෙන් වැටුණු මිනිහත් වෙදු වුණා වගෙයි.
iv. ජාඩියට මූඩිය වගෙයි.

## ක්‍රියාකාරකම 04

**පහත දැක්වෙන එක් එක් කවි දෙපදය පිරුළක් සේ යොදු ගත හැකි අවස්ථාව බැගින් ලියන්න.**

i. **මිතුරන් හිතවතුන් කී හැම** **ඉවත හෙළා**
**පැනයන මුවන් දැක නොදමවු** **නෙළුඃ පලා**

ii. **තඹුරු වනය මුකුලිත වන බව** **සවස**
**කවුරුහට ද වැළකිය හැකි මෙදිය** **කුස**

iii. **බරණිඳු ගෙල වසන නාරද වෙමින්** **ගරු**
**ගුරුළිඳු අතින් ඇසි කිම යහළු තොර** **තුරු**

iv. **ලීයේ ඇදය හරිතත් හුය ලා** **අඟුරු**
**වෑයේ කුදය බැලුවම ඊටත්** **නපුරු**

## ක්‍රියාකාරකම 05

ගහ දන්න අයට කොළ කඩා පාන්නේ කුමට ද? යන ප්‍රස්තාව පිරුළ හා සම්බන්ධ කළ හැකි කතාවක් ලියන්න.